# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2022/34 - 2017 ජුනි මස 09 වැනි සිකුරාදා - 2017.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2015 සැප්තැම්බර් මස 21 වැනි දිනැති අංක 1933/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලදුව වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2017 ජුනි මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ජුනි මස 07 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය (අංක 4) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 11 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 7 සහ 13 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඇ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත සඳහන් පනත් ඉවත් කිරීමෙන් ;

* සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46)
* සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19)

(ඈ) එහි I වැනි තීරුව පහත සඳහන් පරිදි වෙනස් කිරීමෙන් ;

1. මුල්‍යය හා ආදායමද ඇතුළත්ව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු විෂයයන්ට, සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
3. ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධීකරණයෙන් මුල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සාර්ව ආර්ථික කළමනාකරණය
4. ජාතික සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති පිළියෙල කිරීම
5. ආදායම් එකතු කිරීම හා වියදම් පිළිබඳ පසු විපරම් කිරීම
6. ආර්ථික සංවර්ධනයේ දී පෞද්ගලික අංශයේ සහභාගිත්වය පහසුකරලීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශ සම්බන්ධීකරණය

උපලේඛනය (සම්බන්ධිතයි)

7. අදාළ ජාතික අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැළසුම්කරණ බලධාරීන් සමග එකඟත්වයට පැමිණ කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
8. මනා සම්පත් කළමනාකරණයකින් යුක්තව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ශිල්ප ක්‍රම යොදා ගනිමින් උචිත ක්‍රමෝපායන් සැකසීම
9. ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණය සහ ආර්ථික සංවර්ධනය සඳහා විදේශ සම්පත් යෙදවීම
10. ආධාර දෙන සංවිධාන සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග කටයුතු සමායෝජනය කිරීම
11. වැටුප් නියම කිරීම පිළිබඳ උපදේශක කටයුතු
12. ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ඇතුලුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
14. යෞවන කටයුතු විෂයයට අදාළ ව්‍යාපෘති, වැඩසටහන් සම්පාදනය, පසු විපරම් කිරීම හා ඇගයීම
15. තරුණ පරපුර නිවැරදි දිශානතියකට යොමුකිරීම අරමුණු කරගත් ආකල්ප සංවර්ධන වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
16. තරුණ පරපුර කේන්ද්‍ර කරගත් අන්තර්ජාතික සහයෝගිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
17. රැකියා විරහිත තරුණයින් කේන්ද්‍ර කොටගත් කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
18. තරුණ සංවිධාන සම්බන්ධ කටයුතු
19. තරුණ ප්‍රජාව ඉලක්ක කරගත් ස්වේච්ඡා වැඩසටහන් සම්පාදනය
20. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
21. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම

(2) එම නිවේදනයෙහි ප්‍රවාහන හා සිවිල්ගුවන් සේවා අමාත්‍ය (අංක 7) ශීර්ෂයේ I වැනි, II වැනි සහ III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

(8) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

1. ජාතික ප්‍රතිපත්ති සැලැස්මට අනුකූල වූ රාජ්‍ය මූල්‍යය, බදුකරණය, සාර්ව මූල්‍ය කළමනාකරණය සහ ජනමාධ්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. මූල්‍ය හා ආදායමට අදාළව ජාතික ප්‍රතිපත්ති හා වැඩසටහන් මෙහෙයවීම
3. රාජ්‍ය මූල්‍ය හා මහා පරිමාණ මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය
4. වාර්ෂික අයවැය පිළියෙළ කිරීම සහ මූල්‍ය සම්පත් කළමනාකරණය
5. ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සහ අයවැයමය සහ මූල්‍ය පාලනය බලාත්මක කිරීම
6. ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය සහ රජයේ ආදායම් ඵලදායී ලෙස පරිහරණය කිරීම

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

1. මහා භාණ්ඩාගාරය
2. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
3. ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
5. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
6. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
7. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
8. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
9. සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
10. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
11. නීති කටයුතු දෙපාර්තමේන්තුව
12. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
13. තක්සේරු දෙපාර්තමේන්තුව
14. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
15. ශ්‍රී ලංකා රේගුව
16. සුරාබදු දෙපාර්තමේන්තුව
17. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති*

* විසර්ජන පනත්
* ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනත (1998 අංක 40)
* රේගු ආඥාපනත (1956 අංක 17)
* හර බදු පනත (2007 අංක 12)
* ආර්ථික සේවා ගාස්තු පනත (2006 අංක 13)
* රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය ආඥාපනත (1891 අංක 5)
* සුරාබදු (විශේෂ විධිවිධාන) පනත (1989 අංක 13)
* සුරාබදු ආඥාපනත (52 වැනි අධිකාරය)
* මූල්‍ය සමාගම් පනත (1988 අංක 78)
* මූල්‍ය කල් බදු පනත (2000 අංක 56)
* මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත (2006 අංක 6)
* රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත (2003 අංක 3)
* දේශීය ආදායම් පනත (2006 අංක 10)
* රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (2000 අංක 43)

(8) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

7. රජයේ මුදල් රෙගුලාසි බලාත්මක කිරීම
8. ඒකාබද්ධ අරමුදල් කළමනාකරණය
9. ආදායම් නියෝජිතායතනයන්හි සමස්ත අධීක්ෂණය
10. පොදු වියදම් කළමනාකරණය
11. රජයේ මිලදී ගැනීම් සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම
12. දෙපාර්තමේන්තුමය හා වෙනත් පොදු අරමුදල් අධීක්ෂණය
13. රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාව පිළිබඳ භාණ්ඩාගාර සටහන් පවත්වාගෙන යාම
14. සේවක සංඛ්‍යා කළමනාකරණය
15. ජනතා ආකල්ප යහපත් මානයන් කරා කේන්ද්‍රගත කරමින් ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා දේශපාලනමය ක්ෂේත්‍රයන්හි ප්‍රගමන කාරකයක් ලෙස ජනමාධ්‍යයෙහි දායකත්වය ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායයන් සම්පාදනය කිරීම
16. ජනතාව තුළ දැනුම, ආකල්ප සහ රසඥතාවයන් ඇති කරලීම උදෙසා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
17. ජනතාවගේ නිවැරදි තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම
18. උසස් මාධ්‍ය සදාචාරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
19. රාජ්‍ය නිල නිවේදන හා ප්‍රවෘත්ති නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම
20. ශ්‍රී ලංකාව පිළිබඳ අදාළ තොරතුරු දේශීය හා විදේශීය ජනමාධ්‍ය ආයතනවලට නිකුත් කිරීම
21. විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට අවශ්‍ය තොරතුරු හා ප්‍රචාරක සේවා සැපයීම
22. ප්‍රකාශනවලට අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ක්‍රියාත්මක කිරීම
23. දෙපාර්මේන්තු ප්‍රකාශන හැර රජයේ ප්‍රකාශන අලෙවිය, ගබඩා කිරීම සහ නිකුත් කිරීමේ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

18. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය
19. රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය
20. ලෝහෝර් ආර්යා අරමුදල
21. බදු අභියාචනා කොමිෂන් සභාව
22. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
23. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
24. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
25. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
26. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව
27. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය
28. සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
29. සීමාසහිත ලංකා පුවත් ආයතනය
30. සැලසිනේ රූපවාහිනී ආයතනය
31. ක්‍රියේටිව් හෙලන්කා ලිමිටඩ්
32. ශ්‍රී ලංකා රූපවාහිනී අභ්‍යාස ආයතනය
33. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි - සිනමා උද්‍යානය (රන්මිහිතැන්න)

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති*

* ලෝහෝර් ආර්යා අරමුදල පනත (1951 අංක 38)
* දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත (1923 අංක 8)
* ජාතිය ගොඩනැගීමේ බදු පනත (2009 අංක 9)
* මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත (2006 අංක 5)
* ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත (1995 අංක 15)
* මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (2006 අංක 12)
* මුද්දර ගාස්තු පනත (1982 අංක 43)
* එකතු කළ අගය මත බදු පනත (2002 අංක 14)
* සුභසාධක ප්‍රතිලාභ පනත (2002 අංක 24)
* මුදල් පනත (1971 අංක 38)
* පරිසර සංරක්ෂණ බදු පනත (2008 අංක 26)
* බදු අභියාචනා කොමිෂන් සභාව පනත (2008 අංක 23)
* ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත (1978 අංක 15)
* ඇසෝසියේටඩ් නිවුස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනත (1973 අංක 28)
* ලංකා ගුවන් විදුලි සංස්ථා පනත (1966 අංක 37)
* ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත (1839 අංක 5)
* ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා (විශේෂ විධිවිධාන) පනත (1996 අංක 8)
* ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත (1973 අංක 5)
* ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත (1982 අංක 6)
* තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (2016 අංක 12)
* වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

(8) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය (සම්බන්ධිතයි)

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති |
|---|---|---|
| 24. ප්‍රවෘත්ති, චිත්‍රපට හා වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රදර්ශනය කිරීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගැනීම | | |
| 25. වාණිජ රූපවාහිනී හා ගුවන් විදුලි ප්‍රචාර සහ විදේශ විකාශයන් ඇතුළු ප්‍රචාරක කටයුතු | | |
| 26. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 27. II තීරුවෙහි දැක්වෙන සියලුම ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(3) එම නිවේදනයෙහි සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍ය (අංක 9) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(9) සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය" වශයෙන් ;
(ආ) එහි I වැනි තීරුවෙහි 12 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :-

''13. කන්ද උඩරට උරුමය සුරැකීම හා වර්ධනය
14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම''

(4) එම නිවේදනයෙහි කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය (අංක 10) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය "(10) කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය" වශයෙන් ;
(ආ) එහි I වැනි තීරුවෙහි 12 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් :-

''13. සබරගමුව පළාත තුළ විශේෂ ව්‍යාපෘති සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය
14. සබරගමුව පළාත තුළ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය
15. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
16. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම''

(5) එම නිවේදනයෙහි විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය (අංක 14) ශීර්ෂයේ I වැනි II වැනි සහ III වැනි තීරුවලට පසුව පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

(අ) ඒ අනුව අංක (15) සිට අංක (34) දක්වා වූ ශීර්ෂයන් නැවත අංක ගත කිරීමෙන් ;

**(15) සංවර්ධන කාර්යභාර අමාත්‍ය**

| I වැනි තීරුව<br>කාර්යයන් හා කර්තව්‍යයන් | II වැනි තීරුව<br>දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා | III වැනි තීරුව<br>ක්‍රියාත්මක කළ යුතු නීති |
|---|---|---|
| 1. ජාතික හා පළාත් මට්ටමින් ව්‍යාපෘති සම්බන්ධීකරණය,මෙහෙයවීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව | * සේවා නියුක්තයින්ගේ භාර අරමුදල පනත (1980 අංක 46) |
| 2. සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්හි ඵලදායී ක්‍රියාකාරීත්වය ස්ථාපිත කරනු පිණිස අනෙකුත් අදළ අමාත්‍යාංශ සමග | 2. සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල | * සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත (1993 අංක 19) |
| | 3. මිලෝද ආයතනය | * වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |

**(15) සංවර්ධන කාර්යභාර අමාත්‍ය (සම්බන්ධිතයි)**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| සම්බන්ධීකරණය | | |
| 3. සංවර්ධන ව්‍යාපෘති වලට අදාළව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව සමග සම්බන්ධීකරණය | | |
| 4. ජාතික ප්‍රතිපත්ති පසු විපරම් කිරීම හා ඇගයීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාට සහාය වීම | | |
| 5. II තීරුවෙහි දක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදළ කටයුතු | | |
| 6. II තීරුවෙහි දක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(6) එම නිවේදනයෙහි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය (අංක 15) ශීර්ෂයේ I වැනි II වැනි තීරුවලට පසුව මුදල් අමාත්‍ය (අංක 16) ශීර්ෂය වෙනුවට පහත සඳහන් නව ශීර්ෂය ඇතුළත් කිරීමෙන් :-

**(17) විදේශ කටයුතු අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| 1. විදේශ කටයුතු විෂයයට සහ II වැනි තීරුවෙහි දක්වෙන ව්‍යවස්ථාපිත ආයතයන්හි විෂයයන්ට අදළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම | 1. විදේශගත රාජ්‍ය දූත මණ්ඩල | * කොන්සල් කර්තව්‍ය පිළිබඳ පනත (1981 අංක 4) |
| 2. විදේශයන්හි ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය නංවාලීම තුලින් ශ්‍රී ලංකාවට උපරිම ජාත්‍යන්තර සහයෝගීතාවක් ලබාගත හැකිවන පරිදි විදේශ රටවල් සමග රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යාම | 2. ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය | * රාජ්‍ය දූත වරප්‍රසාද පනත (1996 අංක 9) |
| 3. ශ්‍රී ලංකාව පිළිබඳ හිතකර ප්‍රතිරූපයක් ගොඩනැගීම සඳහා ක්‍රියාකිරීම සහ ජාත්‍යන්තර වශයෙන් එල්ලවන විරුද්ධවාදී ප්‍රචාරයන් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාර දක්වීම | 3. ජාතික සමුද්‍ර කටයුතු කාරක සභා ලේකම් කාර්යාලය | * සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත (1997 අංක 20) |
| 4. විදේශ රටවල් සමග රාජ්‍ය දූත සබඳතා පවත්වාගෙන යාම හා ප්‍රඥප්ති, ගිවිසුම් සහ සම්මුතීන් පිළිබඳ සාකච්ඡා කිරීම | 4. ජාතික ලොතරැයි මණ්ඩලය | * වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 5. රාජ්‍ය දූත විශේෂ මුක්ති හා වරප්‍රසාද ලබාදීම | 5. සංවර්ධන ලොතරැයි මණ්ඩලය | |

**(17) විදේශ කටයුතු අමාත්‍ය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| 6. විදේශීය වෙළඳ හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සහායවීම | | |
| 7. ශ්‍රී ලංකා විදේශ සේවාව සහ විදේශීය දූත මණ්ඩලවලට අනුයුක්ත කරනු ලබන නිලධාරීන්ගේ පරිපාලනය සහ වෘත්තීමය ධාරිතා නැංවීමට අවශ්‍ය පියවර ගැනීම | | |
| 8. භූ දේශපාලන ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකාවට හිතකර අයුරින්, එම ප්‍රවණතා කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ග පිළිබඳ රජයට උපදෙස් දීම | | |
| 9. විදේශ රටවල වාසය කරන ශ්‍රී ලාංකිකයින්ගේ සුබසාධනය පිලිබඳ අවශ්‍ය පියවර ගැනීම | | |
| 10. ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය හා සමුද්‍රික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය වන විදේශ සබඳතා තහවුරු කිරීම | | |
| 11. ජාතික ප්‍රශ්නයට අදළ යාන්ත්‍රණයන් පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුලු අන්තර්ජාතික ප්‍රජාව සමඟ ක්‍රියාකිරීම | | |
| 12. ජාතික ප්‍රතිපත්තියට අදළ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීම හා සම්බන්ධීකරණය | | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදළ කටයුතු | | |
| 14. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(7) එම නිවේදයෙහි රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය (අංක 30) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය ''(31) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය'' වශයෙන්

(ආ) එහි II වැනි තීරුවෙහි 5 වැනි අයිතමයට පසුව පහත අයිතමයන් එකතු කිරීමෙන් ;

''6. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

7. ජාතික චිත්‍රපට සංස්ථාව

8. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව''

(ඇ) එහි III වැනි තීරුවෙහි ''තැගි පිරිනැමීමේ තරග පනත (1957 අංක 37) '' යන්නට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

* රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත (1971 අංක 47)
* රාජ්‍ය මුද්‍රණ සංස්ථා පනත (1968 අංක 24)

(8) එම නිවේදනයෙහි පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය (අංක 31) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එම ශීර්ෂය ''(32) ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය'' වශයෙන්

(ආ) එහි I වැනි, II වැනි සහ III වැනි තීරුවල දැක්වෙන අයිතමයන් ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

**(32) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| 1. ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ විෂයයන්ට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | * ඉඩම් අත්කර ගැනීමේ පනත (1950 අංක 9) |
| 2. රජයේ ඉඩම් පරිපාලනය, කළමනාකරණය හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය | 2. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | * ඉඩම් සංවර්ධන ආඥාපනත (1935 අංක 19) |
| 3. ඉඩම් නිරවුල් කිරීම හා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු | 3. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | * ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත (1942 අංක 61) |
| 4. රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නාවූ ඉඩම් අප්‍රමාදව හා නියමානුකූලව ලබාදීම | 4. මිනුම්පති දෙපාර්තමේන්තුව | * ඉඩම් නිරවුල් කිරීමේ ආඥාපනත (1931 අංක 20) |
| 5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් පරිපාලනය හා නීත්‍යානුකූලව බෙදදීම | 5. මිනින්දෝරු සහ සිතියම් ආයතනය | * රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත (1979 අංක 43) |
| 6. ඉඩම් මැනීම සහ සිතියම්ගත කිරීම, ඉඩම් තොරතුරු සහ අදාළ සේවාවන් ලබාදීම | 6. ඉඩම් මැනුම් සභාව | * රජයේ ඉඩම් ආඥාපනත (1947 අංක 8) |
| 7. පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතුවලට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන් | 7. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | * ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත (1972 අංක 1) |
| 8. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආයතනික සහ විනය කරුණු සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතු | 8. කන්තලේ සීනි සමාගම | * රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත (1979 අංක 7) |
| 9. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලවලට සම්බන්ධ ආයතනික කටයුතු | | * මැනුම් පනත (2002 අංක 17) |
| 10. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුභසාධන කටයුතු | | * වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 11. පාර්ලිමේන්තු අධීක්ෂණ ප්‍රතිසංස්කරණ වලට අදාළ කටයුතු | | |
| 12. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 13. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

(9) එම නිවේදනයෙහි ඉඩම් අමාත්‍ය (අංක 34) ශීර්ෂය ඉවත් කිරීමෙන් ;

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.